**විගණන පශ්චාත් උපාධි ආයතනය - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | | | |
| | i. 02 හා 4.5 ඡේද | සියලු ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් ලාභ නොලබන පදනමින් හා පිරිවැය ආවරණය වන පදනමින් පවත්වාගෙන යා යුතු බවට දක්වා ඇතත්, 2018 ජනවාරි 01 දින සිට 2022 ජූලි 31 දින දක්වා ක්‍රියාත්මක කර තිබුණු පාඨමාලා 12කට අදාලව අයවැයගත ආදායම රු.29,245,000 ක් සම්බන්ධයෙන් එම නියමයන්ට පරිබාහිරව අයවැය ලේඛන පිළියෙල කර තිබුණි. | අයවැයගත වියදමට වඩා අයවැයගත ආදායම වැඩි ලෙස දක්වා ඇති ක්‍රියාකාරකම්වලට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි මෙම අතිරික්තයන්ද සංවර්ධන වැය විෂයයන්ට ඇතුලත් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| | ii. 4.5 ඡේදය | 2018 ජනවාරි 01 දින සිට සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා කාල පරාසය තුළ අවසන් | අවසන් කර ඇති ක්‍රියාකාරකම් සඳහා වන මූල්‍ය ප්‍රකාශන මේවන විටත් සකස් කරමින් | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ |

| | | | | |
|---|---|---|---|---|
| | | කරන ලද අයවැයගත ආදායම රු.209,370,600 ක් වූ ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 55 කට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | පවතින අතර ඉදිරියේදී අවශ්‍ය අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කරන බව. | යුතුය. |
| iii. | 5.2.1 ඡේදය | මුළු චක්‍ර පිරිවැයෙන් සියයට 15 සිට සියයට 30 දක්වා ප්‍රමාණයක් ආයතනයේ සංවර්ධන වැය විෂයයන් සඳහා වෙන් කළ යුතු වුවත්, 2018 ජනවාරි 01 දින සිට 2022 ජූලි 31 දින දක්වා කාලය තුළ ක්‍රියාත්මක කරන ලද ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 21 කට අදාළව අයවැයගත ආදායම රු.58,840,600 කින් ආයතනයේ සංවර්ධන වැය විෂයයන් සඳහා වෙන් කිරීම් සිදු කර නොතිබුණි. | ආයතනයේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් කිසිදු භාණ්ඩාගාර ප්‍රතිපාදනයක් නොලැබෙන බැවින් සියළු පොදු කාර්යය වියදම් පිළියෙල කරනු ලබන ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලට අදාළ අයවැය ලේඛන මඟින් ආවරණය කර ගැනීමට සිදු වන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.241,374,252 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.48,462,794 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.192,911,458 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම වැඩිවීමට පොලී ආදායම රු.49,044,377 කින් වැඩිවීම, විදේශ විනිමය හුවමාරු ලාභ රු.163,531,566 කින් හා සේවක පරිශ්‍රමික වියදම් රු.8,022,635 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලයට අදාළව සිසුන් 1891 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.30,259,400 ක හිඟ පාඨමාලා ගාස්තු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | හිඟ පාඨමාලා ගාස්තු ගෙවීමට කටයුතු කරන ලෙස සියලුම සිසුන් වෙත සිහි කැඳවීම් යවා ඇති අතර මෙම හිඟ පාඨමාලා ගාස්තු ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ පාඨමාලා ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පර්යේෂණ කාල සීමාව අවසන් වූ රු. 12,580,485 ක පර්යේෂණ ප්‍රදාන 06 කට අදාළව පර්යේෂණ අවසන් කිරීමට හෝ එහි කාලය දීර්ඝ කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් කටයුතු කර නොතිබීම | විවිධ හේතූන් මත පර්යේෂණ ප්‍රදාන 06 ක කටයුතු අවසන් කිරීමට හෝ කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොමැති බව. | නියමිත කාල සීමාව තුළදී පර්යේෂණ කටයුතු අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් අදාල පර්යේෂණ අතර මඟ නවතා දමා තිබුණි. | | |
| (ඇ) | 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබුණු රු.75,457,930 ක පර්යේෂණ ප්‍රදාන 19 ට අදාළව පර්යේෂණ පත්‍රිකා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම පළ කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පර්යේෂණ ප්‍රදානලාභීන් විසින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම මේවන විටත් සිදුකරමින් පවතින බව. | නියමිත කාල සීමාව තුළදී පර්යේෂණ කටයුතු අවසන් කළ යුතුය. |
| (ඈ) | පර්යේෂණ ප්‍රදානයන් 06 ක් වෙනුවෙන් ලැබී තිබුණු රු.1,430,243 ක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් හා පර්යේෂණ ප්‍රදාන 04 ක් වෙනුවෙන් ලැබී තිබුණු රු.2,038,815 ක් අදාළ ආයතන සමඟ ගිවිසුම්වලට එළඹීමට කටයුතුකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ඌන උපයෝජිතව පැවතුණි. | ඉදිරියේදී මෙම පර්යේෂණ ප්‍රදානයන් 06 ට අදාළව අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට අපේක්ෂා කරන බව හා විවිධ හේතූන් මත පර්යේෂණ ප්‍රදාන 04 කට අදාළව ගිවිසුම්වලට එළඹීමට නොහැකි වී ඇති බව. | අරමුදල් ලැබී ඇති කාර්යයන් සඳහා කාර්යක්ෂමව උපයෝජනය කිරීමට හා පර්යේෂණ ප්‍රදානවලට අදාළ ගිවිසුම්වලට කඩිනමින් එළඹිය යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ අවසන් කරන ලද පර්යේෂණ ප්‍රදාන 06 ට අදාළව මිලදී ගෙන තිබුණු රු.2,087,783 ක ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ආයතනයට පවරා ගැනීමට හෝ අදාළ ව්‍යාපෘති වෙත බාරදීමට හෝ කටයුතු කර නොතිබුණි. | මෙම පර්යේෂණ ප්‍රදානවලින් මිලදී ගත් ස්ථාවර වත්කම් විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට ස්ථිර වශයෙන් පවරා ගැනීම සඳහා අදාළ පර්යේෂණලාභීන් මේ වන විටත් දැනුවත් කර ඇති බව. | ස්ථාවර වත්කම් පවරා ගැනීමට හෝ භාරදීමට කටයුතු කළ යුතුය. |